# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2018/05 - 2017 මැයි 08 වැනි සඳුදා - 2017.05.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගන්දහය කෝරළේ සුළු කොට්ඨාසයේ පින්නගොල්ල ජනපදය ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එම්ඒඑච්/පීටීඑච්/2016/238 හා 2016.10.19 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර ''ඒ'' ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0506 ක් පමණ වන පින්නගොල්ල ජනපදය නැමැති ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර ''ඒ'' – පින්නගොල්ල ජනපදය – ප්‍රමාණය: **හෙක්. 0.0506 ක් පමණ**

උතුරට: ආර්. මුරුගේෂ් හිමිකම් කියන පින්නගොල්ල ජනපදය;
නැගෙනහිරට: කේ. අදිසිවම් හිමිකම් කියන පින්නගොල්ල ජනපදය;
දකුණට: එම්. ජී. ප්‍රේමරත්න හිමිකම් කියන පින්නගොල්ල ජනපදය;
බටහිරට: එච්. ඒ. එස්. හෙට්ටිආරච්චි හිමිකම් කියන පින්නගොල්ල ජනපදය.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය : 4-3/9/2015/ඩබ්ලිව්එස්/116.
2017 පෙබරවාරි මස 13 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

05-642